# ළමා පරපුරේ පොත්පත් කියැවීමේ රුචිය හා උනන්දුව කෙරෙහි රූපවාහිනී මාධ්‍ය වීසින් කරනු ලබන බලපෑම පිළිබඳ සමාජ සන්නිවේදනාත්මක විමර්ශනයක්

සේන නානායක්කාර*

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජ විද්‍යා හා මානව ශුස්ත්‍රපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*senananayakkara@yahoo.com

**කේන්ද්‍රීය වචනඃ** වාචික සන්නිවේදනය, අවාචික සන්නිවේදනය, දෘශ්‍යගෝචර හා ශ්‍රව්‍යගෝචර, ඒකපාර්ශවික සන්නිවේදනය, අභිප්‍රේරණය

## හැඳින්වීම හා අරමුණු

රූපවාහිනිය වූ කලී නූතන ලෝකයේ වඩාත් බලසම්පන්න ම හා ප්‍රචලිත ම ජනමාධ්‍යය වෙයි. අවාචික සන්නිවේදනයෙන් ඇරඹුණු තොරතුරු හුවමාරුව වාචික සන්නිවේදනයට ත්, අනතුරුව ඉන් ඔබ්බට ත් විකාශනය වී නූතන විද්‍යුත් තාක්‍ෂණය දක්වා ප්‍රවිශ්ට වී ඇත. අද වන විට එය සෘජු චන්ද්‍රිකා පණිවිඩ පද්ධති **(direct satellite message system)** දක්වා වර්ධනය වී ඇත. රූපවාහිනිය වූ කලී එහි ජනප්‍රියතම මාධ්‍ය ක්‍රමවේදය යි. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාද සම්පාදනය හා කාර්යයන් සඳහා පෙළැඹවීම ආදී වශයෙන් සුවිශාල කාර්යභාරයක් ඉටුකරන්නා වූ එයින් මානව වර්ගයාගේ දෛනික ජීවිතය කෙරෙහි එල්ල කෙරෙන බලපෑම ගැඹුරින් සොයාබැලිය යුත්ත කි. ඒ අනුව, විවිධ සමාජ කොටස් කෙරෙහි එහි බලපෑම් ප්‍රවණතාව විවිධාකාර බැව් විවිධ පර්යේෂණ ඇසුරින් පෙන්නුම් කෙරේ. නමුත්, අතිශය දියුණු දෘශ්‍ය මාධ්‍යයක් ලෙස එය කුඩා දරුවන්ගේ ජීවිතවල විවිධ පැතිකඩ කෙරෙහි කරනු ලබන බලපෑම මේ වනවිට ත් පර්යේෂණයට ලක්වෙමින් පවතින්න කි. ඒ සඳහා ගැඹුරු විද්‍යාත්මක ප්‍රවේශයකට පසුබිම සැකසීම ත්, එබඳු පර්යේෂණ සඳහා ශාස්ත්‍රීය ප්‍රතිෂ්ටාවක ඌන පූරණය සිදුකිරීම ත් මෙම අධ්‍යයනයෙන් අරමුණු කෙරේ.

## අධ්‍යයන ගැටලුව

නූතන සමාජ බලපෑම් කාරකයක් ලෙස රූපවාහිනියෙහි ක්‍රියාකාරීත්වය අතිශය විස්මිත යැයි හැඟේ. සමාජ ප්‍රගමනය කෙරෙහි මෙන් ම සමාජ අවගමනය කෙරෙහි ද එහි සෘජු මෙන්ම වක්‍ර බලපෑම් ද ප්‍රත්‍යක්‍ෂ කෙරෙන පර්යේෂණයන් ගණනින් සුවිශාල ය. නමුත්, කුඩා දරුවන්ගේ (ළමා පරපුරේ) පොත්පත් කියැවීමේ රුචිය හා උනන්දුව කෙරෙහි රූපවාහිනී මාධ්‍යයේ බලපෑම කුමක් ද? මෙය මෙම විමර්ශනයෙහි ලා සලකා බැලෙන කේන්ද්‍රීය ගැටලුව යි.

## න්‍යායික පසුබිම හා අධ්‍යයන ක්‍රමවේදය

නූතන දෘශ්‍ය තාක්ෂණය හමුවේ සියලු සමාජ ක්ෂේත්‍රයන් බෙලහීන වන තරමට ම එහි මාධ්‍ය බලපෑම පිළිබඳ සාක්ෂි සුලබ ය. ලෝක පරිමාණයෙන් ගත්කල එය එසේ වුව ද, ලාංකේය ළමා පරපුර කෙරෙහි අවධානය යොමුකිරීම මෙයින් අපේක්ෂිත ය. නමුත්, ගෝලීයකරණ සමාජ වපසරියක ජීවත්වන අප ලෝක පරිමාණයේ අන්තර්ජාතික බලපෑම් පිළිබඳ ගැඹුරින් අවධානය යොමුකිරීමක් ද මෙහිදී සිදුකෙරේ. ඒ අනුව, උක්ත පර්යේෂණ අධ්‍යයනයෙහි ලා අනුගමනය කෙරුණු ප්‍රමුඛතම ක්‍රමවේදයන් ද්විත්වයකි.

(i) අදාළ ගැටලුවට ආනුෂාංගික ව ප්‍රකාශිත මුද්‍රිත මාධ්‍ය ප්‍රමුඛ පොත්පත්, සඟරා, පර්යේෂණ වාර්තා ඇතුළත් ලිඛිත සාහිත්‍යය හා ඊට අදාළ රූපවාහිනී වැඩසටහන් විමසුමට ලක්කිරීම.

(ii) රටේ විවිධ දිසාවන් නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරාගත් විවිධ ප්‍රජා කොටස් ඇතුළත් ප්‍රතිචාරක සමූහයක් හා සාකච්ඡා කිරීම හා සිද්ධි අධ්‍යයනය.

## ප්‍රතිඵලය හා සාකච්ඡාව

රූපය දෘෂ්ටිගෝචර ය. ඇස් කන් නාසා දිව හා සම ආදී වූ පංචේන්ද්‍රියයන්ගෙන් වඩාත් වැදගත් වූ දෘෂ්ටින්ද්‍රිය අප අධ්‍යාත්මය කෙරෙහි බලපෑම් කරන්නා වූ ආකාරය ඉතා සුවිශේෂ ය. ඉලෙක්ට්‍රෝන රූප රාශියකින් හා ශබ්ද මාලාවකින් කෙරෙන සංජානන ක්‍රියාවලිය රූපවාහිනිය මගින් සිදුකෙරෙයි. **(Eastman, Sydney and Levis 1981:121)** එය රූපමය හා ශබ්දමය සංඥා හා සංකේතාවලියක් ලෙස **(visual and auditory signals and symbols)** මිනිස් මනස හා සම්බන්ධ කෙරේ. මෙකී රූප හා ශබ්ද යම්කිසි හැඟීම් මාත්‍රයක් නියෝජනය කරයි. ඒවා අඩුවැඩි වශයෙන් ප්‍රබල හෝ දුබල හෝ විය හැකියි. බලපෑම්කාරකයක් ලෙස විචල්‍ය බවක් පෙන්නුම් කරයි. එහෙත්, කිසියම් ගැඹුරු ප්‍රතිරූපයක නිෂ්පත්තියක් එමගින් හෙළිදරව් කෙරේ. **(Eastman, Sydney and Levis 1981:122)**

එනම්, මිනිසුන් කතාකරන, කන බොන, අඳින පළඳින හා හැසිරෙන කුදුමහත් සකලවිධ ක්‍රියාකාරකම් පද්ධතියක පිළිබිඹුවක් මිනිස් මනසට ප්‍රදානය කරයි. ප්‍රේක්ෂකයෝ, රසිකයෝ හෝ පොදුවේ ගත්කල ග්‍රාහකයෝ එය නරඹති. ස්වකීය සිත හා කිසියම් ගනුදෙනුවක යෙදෙති. එය ප්‍රතිචාරාත්මක ය. සැබැවින් ම එය එක්තරා පෙළ කියැවීමක් **(text reading)** වෙයි. **(Slant, 1986:21)** විටෙක එය අපි අනුකරණය කරමු. තවත් විටෙක පිළිගනිමු. පිළිකෙව් කරමු. දෘශ්‍යමය හා ශ්‍රව්‍යමය සංඥා හා සංකේත විසින් කිසියම් වෙනස් අරමුණක්, පරමාර්ථයක්, විශ්වාසයක් හෝ ක්‍රියාකාරකමක් දක්වා හෝ මිනිස් සිත ගමන් කරවනු ලබන්නේ එලෙසිනි.

අදාළ පර්යේෂණ අධ්‍යයනයේ දී ප්‍රතිචාරකයින් ලෙස මා මුණගැසුණු දරුවන්ට හා වැඩිහිටියන්ට ද උක්ත කාරණාවන් පොදු සත්තාවන් වෙයි. රූපවාහිනී මාධ්‍ය තාක්ෂණය හා බැඳුණු මානව විද්‍යාත්මක මෙන්ම ජීවවිද්‍යාත්මක සත්‍යතාවන් මෙහිදී

ගැඹුරින් සලකා බැලේ. පොත පත කියැවීම සම්බන්ධයෙන් දරුවා තුළ පෙරසිට තිබූ උනන්දුව හා රුචිය කෙරෙහි එකී කාරණය බලපා ඇත්තේ කෙබඳු ආකාරයෙන් ද? දරුවන් රූපවාහිනිය හා හුදෙකලා කොට දෙමාපියන් සිය දෛනික කටයුතු ඉටුකර ගැනීම නිසා පවුල් සංස්ථාව තුළ පෙර තිබූ පොදු ක්‍රියාකාරකම්, පිළිසඳරමය සාකච්ඡාවන් හා සමීප අදහස් ගනුදෙනු ක්‍රමයෙන් අඩුවන්නට හේතුවන බව ත්, එය පවුලේ අභ්‍යන්තරික සාමූහිකත්වයට බාධාවක් විය හැකි බවත් සමහර දෙමාපියන් ලබාදුන් තොරතුරු විග්‍රහයේ දී හෙළි කෙරිණි.

"රූපවාහිනිය වූ කලී මිනිසා නැවතත් ගල්ගුහා ජීවිතයකට හුරු කරවන්නක් ය." (සිල්වා 1993:12) යන කියමන ත් ඒ තුළින් මිනිසා වඩාත් සංකීර්ණ ඉලෙක්ට්‍රෝන ලෝකයක් කරා ප්‍රවේශවීමේ භාවනාවකට කමටහන් ලබනු ඇතැයි **(Ward 1986: 117)** යන ප්‍රකාශයත් මෙහිදී වැදගත් වෙයි. රූපවාහිනී මාධ්‍ය විසින් යහපත් මානව සම්බන්ධතා තවදුරටත් අවගමනය කරා කැඳවන්නට ඇති ඉඩකඩ ගැන මේ උපකල්පනවලින් පැහැදිලි ය. ඒ සමගම ඔවුන් පොතපත කියවීම ඇතුළු ආධ්‍යාත්මික පරිසරයෙන් ඈත්වීමට ප්‍රමුඛ ලෙස බලපෑම් කරන චර්යාමය පෙළැඹවීම් දෙකක් ගැන සඳහන් කළ හැකි ය.

1. හුදු ඉලෙක්ට්‍රෝනික රූප පද්ධතිය තුළ දිදුලන මනස්කාන්ත බවට වහල්වෙන ළදරු මනස බොහෝවිට කාලය හා අවකාශය පිළිබඳ පැවැතිය යුතු යථාවබෝධයෙන් ඈත්වීම පළමුවැන්න යි. රූපවාහිනියෙන් දරුවා දකින දේ කෙරෙහි ඇස් අයාගෙන බලාසිටින්නට ත්, කිසිදු ප්‍රතිචාරයකින් තොර, ඒකපාර්ශවික සන්නිවේදයක **(oneway communication)** යෙදෙන්නට හා එනිසා ම හුදෙකලාව කෙරෙහි ආසක්ත වූ දීර්ඝ නිහඬතාවක් අනුගමනය කරන්නට ත් දරුවා පෙළැඹේ.

2. එහි ප්‍රතිරූපණය කෙරෙන මිනීමැරුම්, වෙඩිතැබීම්, බෝම්බ පිපිරවීම්, ලේ වැගිරීම් ආදී රළු සිද්ධිමය ජවනිකා හා කර්කශමය ශබ්ද තුළින් දරුවාගේ ආධ්‍යාත්මික ජීවනය තුළ යථාවත්ව පැවතිය යුතු සරල රිද්මය ප්‍රචණ්ඩ ලෙස බිඳ වැට්ටවීම මෙමගින් සිදුකෙරේ.

විශේෂයෙන් ම දරුවන් හා දෙමාපියන් අතර මානව සම්බන්ධතා ගිලිහීම යනු ඉතා ව්‍යසනකාරී බෙදවාචකයක් බව අප දන්නා සමාජ සත්තාවකි. රටක සමාජයක හෝ පවුලක හෝ අභ්‍යන්තරයෙහි පැවතිය යුතු යහපාලනය පලුදු කිරීමෙහි ලා වන ප්‍රබලතම සාධකය එය බව නූතන සමාජවිද්‍යාඥයින්ගේ ද පිළිගැනීම යි. **(Ward 1986:118)**

චිකාගෝ හි ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ලෙනාඩ් ඩී. එරන් ප්‍රකාශ කරනුයේ රූපවාහිනියේ විකාශිත ප්‍රචණ්ඩ ක්‍රියා අධිග්‍රහණය වූ කලී සමාජයේ කලහකාරී බවට ත්, අපරාධ හා විනයවිරෝධී සමාජ ප්‍රතිවිරෝධතාවන්ට ත් සත්‍ය වශයෙන් ම හේතුවන බව යි. කිසිදු කොන්දේසියකින් තොරව සියලු සමාජ ආර්ථික හා බුද්ධි මට්ටම්වල පසුවන ගැටවර වියේ ගැහැණු පිරිමි දරුවන් පොතපත

කියවීමේ උනන්දුව හා රුචිය කෙරෙහි මෙය අතිශයින් බලපෑම්සහගත වන බව ද එමගින් හෙළිදරව් කෙරේ.

දරුවන් නිරන්තරයෙන් අසන දකින කුඩුමහත් සමාජ සංසිද්ධීන් ස්වකීය ජීවන චර්යාව කෙරෙහි ලා වන බලපෑම් සහගත සංඥාවන් ය. රූපවාහිනිය බඳු ප්‍රබල ආකර්ශනීය ජනමාධ්‍යයකින් සිය මනසට ඇතුලු කෙරෙන ඉඟි ඔවුන්ගේ විශ්වාසනීයත්වය (credibility) වඩවාලයි. එමගින් ගොඩනැගෙන පරිකල්පනය (imagination) විසින් ඔවුන්ගේ අත්දැකීම් කේන්ද්‍රය (field of experience) පෝෂණය කෙරේ. එය යහපත් ද අයහපත් ද යන්න විමසීමට වඩා හුදෙක් පෘථග්ජන ප්‍රතිචාරාත්මක සිතිවිලි දාමයක දුවටෙන්නට ඔහු උත්සුක වේ. ඒ තුළින් මතුකෙරෙන අභිප්‍රේරණය (motivation) හෙවත් පෙළැඹවීම (persuasion) සිය ජීවිතයට බලපෑම් කරනුයේ ඔහුට ත් නොදැනුවත්ව ම ය.

එකී රසකාරකය මගින් ළමා පරපුර තුළ ජනප්‍රිය මතවාදයක් ගොඩනගන්නට ත් (construct of popular ideology) එමගින් යථාර්ථයෙන් බැහැර වූ මායාවී ලෝකයක් (fantasy world) සඳහා පදනම සකසන්නට ත් පහසුවෙයි. විනෝදය තුළින් යථාර්ථය (reality through the entertainment) අවබෝධ කරවනු වෙනුවට උක්ත මායාවී ලෝකය තුළ දරුවන් සිරකර තැබීම හෝ අවම වශයෙන් ඔහු ඒ කෙරෙහි හුරුවීමට හෝ ඉඩ අවකාශ ලබාදීම වූ කලී නූතන සමාජ රටාව තුළ වන ප්‍රමුඛතම අනන්‍යතාවක් බවට පත්ව ඇති බව පෙනේ. විෂයාවබෝධයකින් තොරව, නිරන්තරයෙන් විභාගවලදී අසමත්කම් දක්වන බහුතර සිසුන් රූපවාහිනිය ප්‍රමුඛ තවත් මාධ්‍යයන්ට ඇබ්බැහිවූවන් වීම මෙහි විශේෂත්වය යි.

මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයන් ලෙස පෙනීසිටි බොහෝ දෙමාපියන් ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, දරුවන්ගේ දෛනික පොතපත කියැවීම ඇතුළත් අධ්‍යාපනික චර්යාව ත්, රූපවාහිනී මාධ්‍ය භාවිතය ත් සපුරා තමන් අධීක්ෂණයට ගත යුතු බව ප්‍රකාශ කෙරේ. දීර්ඝකාලීන ව පොතපත කියවා අධ්‍යාපනික චර්යාවක් සහිත ව ගොඩනැගෙන දරුවා ත්, දීර්ඝ කාලීන ව රූපවාහිනිය භාවිතය නිසා පොතපත කියවීමෙන් ඈත් වූ දරුවා ත් අතර සුවිශේෂ චර්යාමය වෙනස් කමක් ඔවුහු දකිති. එබැවින්, පෙර කී අධීක්ෂණ කාර්යභාරයට ඇතුළත් රූපවාහිනී මාධ්‍ය භාවිතය පිළිබඳ එක්තරා මට්ටමේ වාරණ ක්‍රියාවලියක් ද අත්‍යවශ්‍ය බව ඔවුන්ගේ අදහස විය. එය වඩාත් අර්ථවත් වූ මනෝවිද්‍යාත්මක අනන්‍යතාවක් සහිත ව ක්‍රියාත්මක කළ යුත්ත කි.

## නිගමනය

රූපවාහිනිය වූ කලී පොදු ජනයාට විවෘත තියුණු විද්‍යුත් මාධ්‍යය කි. ශ්‍රව්‍ය ගෝචරභාවය හා දෘශ්‍යගෝචරභාවය යන මාධ්‍ය ශක්‍යතා ද්විත්වය කරණකොටගෙන එය වඩාත් ආකර්ශනශීලී වෙයි. ආධ්‍යාත්මික පරිකල්පනයක් පුළුල් කරනු වෙනුවට බොහෝ විට එමගින් විචිත්‍රශීලී විනෝදාත්මක රස සංජානනයක් සිදුකෙරේ. එබැවින් ම, රසය සොයායන ළමා පරපුරේ පොතපත කියැවීමේ රුචිය හා උනන්දුව කෙරෙහි මෙයින් සිදු කෙරෙන අයහපත් බලපෑම ප්‍රත්‍යක්ෂ ය. එය අර්ථවත් ලෙස විද්‍යාත්මක ව පාලනය කළ යුත්ත කි.